
# සමාජ විග්‍රහ

# Samaja Viggraha

## පළමුවන කාණ්ඩය-පස්වන වෙළුම



සමාජ විද්‍යා අධ්‍යයනාංශය

කොළඹ විශ්වවිද්‍යාලය

# සමාජ විග්‍රහ

**විමර්ශිත සංග්‍රහය**
**REFEREED JOURNAL**
**2020 පළමුවන කාණ්ඩය - පස්වන වෙළුම**
**ISSN 2362-0978 (print ISSN)**
**ISSN 2756-925X (e-ISSN)**

ලිපි අංක 04

## 3D රැකියා සඳහා විදෙස්ගත වී කුට්ටනයට ගොදුරු වන ශ්‍රී ලාංකික කාන්තාවෝ

*වී.පී. නේත්‍රා සේනාධි*[1]

***ප්‍රධාන සංස්කාරක***
ප්‍රේමකුමාර ද සිල්වා

***සහය සංස්කාරක***
එම්.ඒ.දිශාන් මදුශංඛ

***සංස්කාරක උපදේශක මණ්ඩලය***
එස්.ටී.හෙට්ටිගේ (සම්මානිත මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
කාලිංග ටියුඩර් සිල්වා (සම්මානිත මහාචාර්ය) පේරාදෙණිය විශ්වවිද්‍යාලය
කේ.කරුණාතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) කැලණිය විශ්වවිද්‍යාලය
සරත් අමරසිංහ (සම්මානිත මහාචාර්ය) රුහුණු විශ්වවිද්‍යාලය
යසාංජලී ජයතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
චන්ද්‍රසිරි නිරිඇල්ල (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
සුභාංගි හේරත් (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
නිශාර ප්‍රනාන්දු (ආචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය

***භාෂා සංස්කරණය***
නාලක ජයසේන

***පරිසැලසුම් නිර්මාණය***
ප්‍රභාත් ගලගමගේ

[1] බී.ඒ. (කොළඹ) එම්.ඒ. (කොළඹ) කථිකාචාර්ය, ප්‍රජාවිද්‍යා අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

# සමාජ විග්‍රහ

**විමර්ශිත සංග්‍රහය**

**REFEREED JOURNAL**

**2020** පළමුවන කාණ්ඩය - පස්වන වෙළුම

**ISSN 2756-925X (e-ISSN)**

**ISSN 2362-0978 (print ISSN)**

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License.

දැනුම වෙත ප්‍රවේශ වීමේ සීමා අතික්‍රමණය සඳහා ලොව බොහෝ ශාස්ත්‍රාලයීය ප්‍රකාශන සම්ප්‍රදායික ප්‍රකාශන අයිතිය පිළිබඳ නෛතික ආකෘතියෙන් විකල්ප ආකෘතියක් වන පොදු නිර්මාණ බලපත්‍ර ක්‍රමයට සංක්‍රමණය වී / වෙමින් ඇත. මේ අනුව විවාරාත්මක දැනුමට විවෘත ප්‍රවේශයක් ලබා දීමේ අරමුණින් "සමාජ විග්‍රහ" විමර්ශිත සංග්‍රහය නිකුත් වන්නේ ඉහත පොදු නිර්මාණ බලපත්‍රය යටතේය.

## ලිපි විමර්ශක මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ මූලාසන මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා, *සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

මහාචාර්ය හර්ෂානා හනීෆා, *සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

මහාචාර්ය චාන්දනී ලියනගේ, *සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

මහාචාර්ය ඉරේෂා එම්. ලක්ෂ්මන්, *සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

ආචාර්ය දිල්රුක්ෂි අබේසිංහ, *සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

ආචාර්ය එම්.ටී.එම්. මහීස්, *සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්ව විද්‍යාලය*

ආචාර්ය ජගත් බණ්ඩාර පතිරගේ, *සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

## ප්‍රකාශනය

සමාජ විද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ-03
දුරකථනය/ෆැක්ස්: 011-2500452
විද්‍යුත් තැපැල: samajaviggraha@soc.cmb.ac.lk
වෙබ් අඩවිය: https://arts.cmb.ac.lk/sociology/

# 3D රැකියා සඳහා විදෙස්ගත වී කුට්ටනයට ගොදුරු වන ශ්‍රී ලාංකික කාන්තාවෝ

**වී.පී. නේත්‍රා සේනාධි**


**සාරසංක්ෂේපය**

දේශසීමා ඉක්මවා සිදුකරනු ලබන සංවිධානය වූ අපරාධයන්ට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥාප්තියට අනුව මානව කුට්ටනය, ජාත්‍යන්තර නීතියේ අපරාධයක් ලෙස පිළිගැනෙන වරදක් වශයෙන් අර්ථ ගන්වා තිබේ (UNODC, 2000). මානව කුට්ටනය තුළදී ශ්‍රමය සූරාකෑමේ අරමුණෙන් හෝ ලිංගික සූරාකෑමේ අරමුණෙන් රටක් තුළ හෝ විදේශයකදී යමකු මුලාකිරීම මගින් හෝ බලෙන් නම්මවා ගැනීම තුළ වහල්භාවයට සමාන තත්ත්වයන් පුද්ගලයන් තුළ ආරෝපණය කිරීම එයට මූලික හේතුවයි. මානව කුට්ටනය තුළ බොහෝ අවස්ථාවන්හිදී කාන්තාවන් වින්දිතයන් බවට පත්වන අතර, එහිදී පහරදීම්, ශාරීරික අඩත්තේට්ටම්, බලහත්කාරී ගබ්සාවන්, බලහත්කාරී ගැබ් ගැන්වීම් ආදී තත්ත්වයන් මූලිකව හදුනා ගැනීමට හැකි වන්නේය (කරා, 2011). ජාත්‍යන්තර ස්ත්‍රී ශ්‍රම සංක්‍රමණය මේ සඳහා පසුබිම නිර්මාණය කරන බවට විවිධ සමීක්ෂණ සහ පර්යේෂණ තුළින් අනාවරණය කර තිබේ (සිද්ධිසේන සහ රණසිංහ, 2016). වර්තමානය වන විට ශ්‍රී ලංකාව ලොව පුරා කුට්ටනයට ගොදුරු වන්නන්ගේ ගමනාරම්භක රාජ්‍යයක් වන බැවින් සහ ජාත්‍යන්තර ස්ත්‍රී ශ්‍රම සංක්‍රමණය ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන අංශයක් බවට පත්වී ඇති පසුබිමක මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ජාත්‍යන්තර ස්ත්‍රී ශ්‍රම සංක්‍රමණයේදී ස්ත්‍රීන් නියුක්තවන රැකියාවන් හේතුවෙන් ඔවුන් සූරාකෑමට සහ හිංසාවට ලක්වන්නේ කෙසේද යන්න විමර්ශනය කිරීමයි. ඒ අනුව මෙම අධ්‍යයනය මූලික වශයෙන් ප්‍රාථමික දත්ත මත පදනම්වන අතර, ජාත්‍යන්තරයේ විවිධ රාජ්‍යයන් තුළ කුට්ටනයට ගොදුරු වී සිටින ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන් පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ 'නැවත සිය රටට පැමිණවීමේ අංශය' වෙත පැමිණි සංක්‍රමණිකයන්ගේ පවුල්වල වයස අවුරුදු 18 වැඩි සාමාජිකයන් 94 දෙනෙකුගෙන් සමන්විත නියැදියක් තුළින් අරමුණුගත නියදි ක්‍රමයට අදාළව තොරතුරු ලබා ගන්නා ලදි. තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය, සිද්ධි අධ්‍යයන, ගැඹුරු සම්මුඛ සාකච්ඡා වැනි මිශ්‍ර ක්‍රමවේදයක් යොදාගත් අතර, දත්ත විශ්ලේෂණය කිරීම සඳහා ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ක්‍රමවේදයක් යොදා ගන්නා ලදි. අධ්‍යයනයේදී අනාවරණය කරගනු ලැබූයේ ගමනාන්ත රාජ්‍යයන් තුළ කාන්තාවන් ලිංගිකමය සහ ශ්‍රම සූරාකෑමට ලක්වීම සඳහා ස්ත්‍රීන් සේවා නියුක්ත 3D රැකියාවන් (අපිරිසිදු Dirty, අපහසු Difficult, අවධානම් Dangerous) මූලිකව බලපෑම් කර ඇති බවයි. එමෙන්ම ස්ත්‍රීන්ගේ අඩු අධ්‍යාපන මට්ටම, විරැකියාව, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක්වීම, ආර්ථික දුෂ්කරතා, ගමනාරම්භ රාජ්‍යය තුළින් තල්ලු කිරීමේ සාධක වශයෙන් ක්‍රියාකල බවයි. එබැවින් මෙම අධ්‍යයනය හරහා නිගමනය කර සිටින්නේ මානව කුට්ටනයේ සංකීර්ණතාවය පිළිබඳ පුද්ගලයන් දැනුවත් කිරීම, ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණයේ නීතිමය පද්ධතීන් ක්‍රමානුකුල කිරීම කාලීන අවශ්‍යතාවයක් වන බවයි.


**ප්‍රමුඛ පද :** ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණය, 3D රැකියාවන්, මානව කුට්ටනය, සංක්‍රමණික කාන්තාවන්

ISSN 2756-925X ISSN 0236-2090

**හැඳින්වීම**

ජනගහනයෙහි සහ සංක්‍රමණයෙහි පවත්නා නිරන්තර වෙනස්වීම සහ සංකීර්ණතාවය තුළ මානව කුට්ටනය, වර්තමානය වන විට ගෝලීය වශයෙන් කථිකාවතට ලක්වූ ප්‍රබල ගැටලුවක් බවට පත්වී තිබේ. අඛණ්ඩ යන්ත්‍රණයක් වශයෙන් අදියර තුනකට විහිදී යන්නා වූ සංවිධානාත්මක අපරාධයක් වශයෙන් විග්‍රහ කරනු ලබන කුට්ටනය නම් වූ ක්‍රියාවලිය තුළ දී සංක්‍රමණිකයන් බඳවා ගැනීම, සංක්‍රමණිකයන් නුපුරුදු වටපිටාවකට ප්‍රවාහනය කිරීම, ගමනාන්ත රාජ්‍ය තුළ දී සූරාකෑමට ලක්කිරීම සිදුකරනු ලැබේ. මෙහි දී බලහත්කාරී ශ්‍රම තත්ත්ව යටතේ සංක්‍රමණිකයන්ට වහල්භාවයට සමාන තත්ත්ව ඇති කිරීමෙහිලා අතරමැදි පාර්ශ්වකරුවන් මානව කුට්ටනය නම් වූ ක්‍රියාවලියට ඉතා සූක්ෂ්ම අයුරින් අවතීර්ණ වේ.

ශ්‍රී ලංකාව ශ්‍රම සංක්‍රමණය තුළින් දේශීය ආදායම් තර කරගන්නා රටක් වන විට, ශ්‍රම සංක්‍රමණ ක්‍රියාදාමය තුළ ව්‍යාප්ත වෙමින් පවතින මානව කුට්ටනය විෂයෙහි මූලික අවධානය යොමුකළ යුතු වන්නේය. ශ්‍රී ලංකාව තුළ අභ්‍යන්තර කුට්ටනය ප්‍රධාන වශයෙන් නිදහස් වෙළෙඳ කලාප තුළට ශ්‍රමය සැපයීම මූලික කර ගනිමින් නිර්මාණය වී ඇති අතර, බාහිර කුට්ටනය ජාත්‍යන්තර වශයෙන් ගෘහ සේවය මූලික කර ගනිමින් ශ්‍රම සංක්‍රමණ ක්‍රියාවලිය තුළ ව්‍යාප්ත වෙමින් පවතින ප්‍රමුඛ ගැටලුවක් බවට පත්වී තිබේ (සිද්ධිසේන සහ රණසිංහ, 2016)ශ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වාර්තා පෙන්වා දෙන පරිදි අද්‍යතන ශ්‍රී ලංකාව, ඉහළ විගමනයක් පෙන්නුම් කරන රාජ්‍යයක් බවට පත්වී තිබේ. එම වාර්තාව තව දුරටත් පෙන්වා දෙන්නේ වර්තමානය වන විට 13% ක ජාත්‍යන්තර සංක්‍රමණික ප්‍රතිශතයක් ශ්‍රී ලංකාව තුළින් වාර්තාවන බවයි. එහිදී ශ්‍රම සංක්‍රමණය මූලික කර ගනිමින් 2017 වන විට 21,2162ක ශ්‍රී ලාංකිකයන් පිරිසක් ප්‍රධාන ශ්‍රම සංක්‍රමණ ධාරා හතක් යටතේ සංක්‍රමණය වන ආකාරය පෙන්වා දී තිබේ[1].

එක්දහස් නවසිය හැත්තෑව දශකයෙන් පසු ශ්‍රී ලාංකිකයන්ගේ අවධානය ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණය කෙරෙහි යොමු වූ අතර, 1986 කාල පරිච්ඡේදයෙන් පසුව එහි ශීඝ්‍ර වර්ධනයක් දැකිය හැකිවිය. 1986 වන විට ශ්‍රී ලාංකික පුරුෂයන්ගේ ඉහළ ශ්‍රම සංක්‍රමණ ධාරාවක් දැකිය හැකි වුවත්, 1988 න් පසුව එම සංක්‍රමණ ධාරාවේ හැරවුම් ලක්ෂය කාන්තාවන්ට වාසිදායක අන්දමින් වාර්තා විය. ඒ අනුව 1988-2006 කාල පරිච්ඡේදය දක්වා ස්ත්‍රීන්ගේ ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණයේ කැපී පෙනෙන වර්ධනයක් දැකිය හැකි වූ අතර, 2008 වර්ෂයෙන් පසුව එය නැවත පුරුෂයන්ට වාසිදායක අන්දමින් සකස්විය.

---

[1]ඉහළ ශ්‍රේණියේ රැකියා, මධ්‍යම ශ්‍රේණියේ රැකියා, ලිපිකරු රැකියා, පුහුණු රැකියා, අර්ධ පුහුණු රැකියා, නුපුහුණු රැකියා, ගෘහ සේවය

ISSN 2756-925X ISSN 0236-2090

වගු අංක 01- ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණ ප්‍රවණතා, 1987-2017

| **වර්ෂය** | **පුරුෂ සංක්‍රමණිකයන්** | | **ස්ත්‍රී සංක්‍රමණිකයන්** | | **මුළු සංක්‍රමණිකයන් ප්‍රමාණය** |
|---|---|---|---|---|---|
| | සංක්‍රමණය වූ ප්‍රමාණය | සංක්‍රමණය වූ ප්‍රතිශතය | සංක්‍රමණය වූ ප්‍රමාණය | සංක්‍රමණය වූ ප්‍රතිශතය | |
| 1987 | 10,647 | 75.37 | 3840 | 24.63 | 14,157 |
| 1988 | 8,309 | 45.09 | 10,119 | 54.91 | 18,428 |
| 1990 | 15,377 | 36.08 | 27,248 | 63.92 | 42,625 |
| 1995 | 46,021 | 26.68 | 126,468 | 73.32 | 172,489 |
| 2000 | 59,793 | 32.82 | 122,395 | 67.18 | 182,188 |
| 2005 | 93,896 | 40.60 | 137,394 | 59.40 | 231,290 |
| 2007 | 103,476 | 47.37 | 114,983 | 52.63 | 218,459 |
| 2010 | 136,850 | 51.16 | 130,657 | 48.84 | 267,507 |
| 2015 | 172,788 | 65.58 | 90,655 | 34.41 | 263,443 |
| 2017 | 139,271 | 65.64 | 72,891 | 34.36 | 212162 |

මූලාශ්‍රයඃ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වාර්තාල 2017

ශ්‍රී ලංකාව තුළ වරින් වර ඇතිවූ සමාජ, ආර්ථික ගතිකත්වය මෙන්ම ශ්‍රී ලංකා රජය විවිධ කාල වකවානු තුළ ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයන් මෙම සංක්‍රමණ ප්‍රවණතාවල ගතිකත්වයට මූලිකවම බලපෑම් කරන ලදි[2]. ඒ තුළ සිදුවූ අනිටු ප්‍රතිඵලය වූයේ කාන්තාවන්ගේ මානව අයිතීන් උල්ලංඝනය වීම සහ ඔවුනට ආර්ථිකමය වශයෙන් ක්‍රියාකාරීවීමට තිබූ අවස්ථා අහිමි වී යාමයි :බාසු, 2003).එමෙන්ම ගමනාන්ත සහ ගමනාරම්භක රාජ්‍ය ඇති කරනු ලැබූ සංක්‍රමණික වාරණ, ශ්‍රී ලංකාව තුළ නීති විරෝධී සංක්‍රමණ ධාරාවක් නිර්මාණය වීමට පදනම සකස්කරන ලදි (පතිරගේ සහ කොලෙයර්, 2011; ඇෆොලයාන්, 2001).

එක්දහස් නවසිය හැත්තෑව දශකය තුළ පැවති නොබැඳි ජාතීන්ගේ සමුළුව මගින්, මැදපෙරදිග රාජ්‍ය සමග මිත්‍රත්වයක් ගොඩනගා ගැනීමට ශ්‍රී ලාංකිකයන්ට අවස්ථාව උදාවීම තුළ ගල්ෆ් කලාපීය රාජ්‍ය කෙරෙහි ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ දැඩි අවධානයක යොමුවීමටත්, එම සංක්‍රමණ ධාරාව අද්‍යතනය දක්වාම ප්‍රසාරණය වීමටත් බලපෑම් කරන ලදි. ඒ අනුව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වාර්තා සඳහන් කරන පරිදි 2017 වනවිට ශ්‍රී ලාංකික ශ්‍රම සංක්‍රමණිකයන් සෞදි අරාබිය, කටාර්, ඇමරිකා එක්සත් අරාබිය, කුවේටය, දකුණු කොරියාව, ඕමානය, මාලදිවයින, ජෝර්දානය, බහරේන් සහ මැලේසියාව යන රාජ්‍ය මූලික කරගනිමින් සංකේන්ද්‍රගතව සිටින අතර එය සමස්ත ශ්‍රම

[2]2007 වර්ෂයේ ශ්‍රී ලංකා රජය මගින් ඇතිකරන ලද ප්‍රතිපත්තියකට අනුව අවුරුදු 05 ට අඩු දරුවන් සිටින මව්වරුන්ට විදේශ රැකියා සඳහා සංක්‍රමණය වීමට වාරණයන් ගෙනෙන ලදි :ජයතිලකල 2008ඊ15-16).

ISSN 2756-925X ISSN 0236-2090

සංක්‍රමණිකයන් ප්‍රමාණයෙන් 93..56% ප්‍රතිශතයකි. ඒ අනුව පෙනී යන්නේ ශ්‍රම සංක්‍රමණිකයන් බහුතරයක් ගල්ෆ් කලාපීය රාජ්‍යයන් තුළ සංකේන්ද්‍රගතව සිටින බවයි (ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වාර්තාව 2017). ඒ අතරින් බහුතර සංක්‍රමණිකයන් ප්‍රමාණයක් නුපුහුණු අංශයේ රැකියාවන් සඳහා මෙන්ම ගෘහ සේවය සඳහා සංක්‍රමණය වී ඇත. සිද්ධිසේන සහ රණසිංහ විසින් (2016) දී සිදුකරන ලද අධ්‍යයනවලට අනුව පෙන්වා දී ඇත්තේ කුවේට්, ජෝර්දානය, සෞදි අරාබිය, කටාර්, ලෙබනන්, ඇමරිකා එක්සත් අරාබිය, ඕමාන්, බහරේන් සහ සිංගප්පූරුව වැනි රාජ්‍ය සඳහා ඇඟලුම් සේවිකාවන්, ගෘහ සේවිකාවන්, කර්මාන්තශාලා සේවිකාවන් ලෙස සංක්‍රමණය වන කාන්තාවන් සහ පුරුෂයන් ගමනාන්තය තුළදීශ්‍රම සූරාකෑම, මානව හිමිකම් උල්ලංඝනය, නිදහස සහ සමානාත්මතාවය අහිමිවීම, බලහත්කාරී ශ්‍රම යෙදවුම්, හිංසාවට ලක්වීම, නොසලකා හැරීම, ලිංගික සූරාකෑම, ගණිකා වෘත්තියවල යෙදවීම් වැනි තත්ත්වයන්ගෙන් පීඩා විඳින බවයි :සිද්ධිසේන සහ රණසිංහ 2016; අමිර්තලිංගම් 2011).

**අධ්‍යයනයේ අරමුණ**

එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය (2005) වාර්තා කරන පරිදි ශ්‍රී ලංකාව යනු මානව කුට්ටනය නම් වූ ගැටලුව බහුලව ව්‍යාප්ත වූ ද, මැඩපැවැත්වීම දුෂ්කර වූ ද රාජ්‍යයකි. එමෙන්ම එක්සත් ජාතීන් විසින් මානව කුට්ටනයේ ස්වාභාවය සහ සංකීර්ණත්වය මත රටවල් වර්ගීකරණය කිරීමේ නිර්ණායක මත පිහිටා ශ්‍රී ලංකාව “Tire 2”රාජ්‍යයක් ලෙස අර්ථ ගන්වා තිබේ (UNODC, 2014).

ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ සාහිත්‍ය මූලාශ්‍රය සඳහන් කරන පරිදි ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණය, කුට්ටනය නම් වූ ගැටලුවට අදාළ ප්‍රස්තුතය නිර්මාණය කරනු ලබයි. ඒ අනුව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් වාර්තා කරන පරිදි ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණයේ දී සංක්‍රමණිකයන් නියුක්තික රැකියා අංශ අනුව කුට්ටනයට ලක්වීම හා සූරාකෑම මෙන්ම හිංසනයට ලක්වීමේ ස්වභාවය සංකීර්ණත්වයට පත්කරනු ලබන බවයි. ඒ අනුව ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණය තුළ සංක්‍රමණිකයන් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ගොනු කරන ලද පැමිණිලි විශ්ලේෂණය කිරීමේදී අනාවරණය වන්නේ ලැබී ඇති පැමිණිලි සහ රැකියා නියුක්තික අංශ අතර සහ සම්බන්ධතාවක් පවතින බවයි.

ISSN 2756-925X ISSN 0236-2090

වගු අංක 02- රැකියා නියුක්තික අංශ වලට අදාළව ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණිකයන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ගොනු කරන ලද පැමිණිලිල 2013

| රැකියා නියුක්තික අංශ | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|
| | සංක්‍රමණය වූ ප්‍රමාණය | ලැබී ඇති පැමිණිලි | සංක්‍රමණය වූ ප්‍රමාණය | ලැබී ඇති පැමිණිලි |
| ඉහළ ශ්‍රේණියේ රැකියා :Professional- | 4927 | 10 | 413 | - |
| මධ්‍යම ශ්‍රේණියේ රැකියා :Middle Level- | 20025 | 169 | 724 | 1 |
| ලිපිකරු රැකියා :Clerical & Related- | 27,576 | 198 | 1,661 | 10 |
| පුහුණු රැකියා :Skilled- | 66,359 | 1029 | 6,680 | 169 |
| අර්ධ පුහුණු රැකියා :Semi –Skilled- | 3392 | 42 | 580 | 3 |
| නුපුහුණු රැකියා :Unskilled- | 67,645 | 1032 | 11,770 | 329 |
| ගෘහසේවය:Housemaid- | 0 | 0 | 88,661 | 6,873 |
| එකතුව | 189,924 | 2,480 | 110,489 | 7,385 |

මූලාශ්‍රඃ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වාර්තාල 2014

වගු අංක 02 ට අනුව විග්‍රහ කළ හැකි වන්නේ 2013 වර්ෂය වන විට කාන්තාවන්ට සාපේක්ෂව පුරුෂ සංක්‍රමණිකයන්ගේ ඉහළ වර්ධනයක් පවතින බවයි. නමුත් ලැබී ඇති පැමිණිලි විග්‍රහ කිරීමේ දී පුරුෂයන්ට සාපේක්ෂව ස්ත්‍රීන්ගේ වැඩි ප්‍රවණතාවක් දැකිය හැකිවේ. එමෙන්ම රැකියා අංශ අනුව සලකා බැලීමේදී පුහුණු සහ විධිමත් රැකියා අංශයවලට සාපේක්ෂව නොපුහුණු සහ ගෘහ සේවය සඳහා සංක්‍රමණය වූවන්ගේ පැමිණිලි ප්‍රමාණාත්මක වශයෙන් ඉහළ අගයක් ගන්නා අතර එම පැමිණිලිවල ස්වභාවය අනුව, ගමනාන්තය තුළ දී පොරොන්දු වූ වැටුප් නොලැබීම, සන්නිවේදනයට බාධා ඇති කිරීම, කායික සහ මානසික හිංසනයට ලක්කිරීම, ප්‍රචණ්ඩත්වයට ලක්වීම තුළ මරණයට පත්වීම යන තත්ත්වයන් වාර්තා විය. ඒ අනුව මෙම තත්ත්වයන් විමර්ශනය කිරීමේදී අනාවරණය වන්නේ මෙම සියලු තත්ත්වය මානව කුට්ටනයට අදාළ තත්ත්ව වන බවයි. නමුත් මෙම තත්ත්ව තුළින් පීඩාවට පත්වන සංක්‍රමණිකයන් කෙරෙහි ආරක්ෂාව සැපයීමේ නෛතිකමය වගකීමක් රජය සතුව පවතින්නේය.

ජාත්‍යන්තර කම්කරු සංවිධානය (2005) සඳහන් කරන පරිදි නීත්‍යානුකූලව සංක්‍රමණය වන සංක්‍රමණිකයන්ට වඩා නීති විරෝධීව සංක්‍රමණය වන සංක්‍රමණිකයන් කුට්ටනයට ගොදුරුවීමේ ඉහළ සම්භාවිතාවක් පවතී. එමෙන්ම එම සංක්‍රමණිකයන්ගේ නීතිවිරෝධීභාවය හේතුවෙන් ඔවුනට ගමනාන්ත රාජ්‍ය තුළ කම්කරු අයිති නොලැබීයාම, ගමනාරම්භක හෝ ගමනාන්ත රාජ්‍යයෙන් නීතිමය රැකවරණය හෝ වගකීම අහිමි වී යාම, නුපුහුණු ශ්‍රමය වැනි තත්ත්වයන් හේතුවෙන්

ISSN 2756-925X ISSN 0236-2090

නිරායාසයෙන්ම 3D රැකියාවන්හි නිරතවීමට සිදුවීම වැනි තත්ත්වයන් හඳුනාගත හැකි වන්නේය (කරාල2011).

එතුළින් ශ්‍රම සූරාකෑමට සහ ලිංගික සූරාකෑමට ලක්වන සංක්‍රමණිකයන් කායික, මානසික, සමාජීය සහ ආර්ථික වශයෙන් පීඩනයට සහ හිංසනයට ලක්වන විට ගමනාරම්භක රාජ්‍යයන් තුළ රැඳී සිටින සංක්‍රමණිකයන්ගේ ගෘහ කුටුම්භවල සාමාජිකයන් සමාජ, ආර්ථික වශයෙන් විවිධ බලපෑම්වලට ලක්වන්නේය. ඒ අනුව මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ 3D රැකියා සඳහා ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණයේ යෙදෙන ශ්‍රී ලාංකික කාන්තාවන් කුට්ටනයට ගොදුරුවීමේ ස්වාභාවය පිළිබඳ විමර්ශනය කිරීමෙන් ප්‍රතිපත්ති සම්පාදනයට අවශ්‍ය කථිකාවතක් නිර්මාණය කිරීමයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය මූලික වශයෙන් ප්‍රාථමික දත්ත මත පදනම් වන අතර, ජාත්‍යන්තරයේ විවිධ රාජ්‍ය තුළ කුට්ටනයට ගොදුරු වී සිටින ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන් පිළිබද පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ නැවත සිය රටට පැමිණවීමේ අංශය වෙත 2016.09.25 සිට 2016.11.21 දක්වා පැමිණි සංක්‍රමණිකයන්ගේ පවුල්වල වයස අවුරුදු 18 ට වැඩි සාමාජිකයන් 94 දෙනෙකුගෙන් සමන්විත නියදියක් තුළින් අරමුණුගත නියදි ක්‍රමයට අදාළව තොරතුරු ලබා ගන්නා ලදි. තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය, සිද්ධි අධ්‍යයන, ගැඹුරු සම්මුඛ සාකච්ඡා වැනි මිශ්‍ර ක්‍රමවේද යොදාගත් අතර, දත්ත විශ්ලේෂණය කිරීම සඳහා ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ක්‍රමවේදයක් යොදා ගන්නා ලදි. එහිදී ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය සඳහා ඒක විචල සහ බහු විචල විශ්ලේෂණ ක්‍රමවේද යොදාගත් අතර, ගුණාත්මක දත්ත විශ්ලේෂණය සඳහා කතාන්දර විශ්ලේෂණ ක්‍රමවේදය යොදාගන්නා ලදි. ප්‍රාථමික දත්තවලට අමතරව විදේශසේවා නියුක්ති කාර්යාංශ වාර්තා, එක්සත් ජාතීන් විසින් ප්‍රකාශයට පත්කරන ලද සංක්‍රමණික වාර්තා මූලික වශයෙන් යොදාගන්නා ලදි.

**සොයා ගැනීම් සහ සාකච්ඡාව**

මෙම අධ්‍යයනයට අදාළව විමර්ශනය කරන ලද කරුණු මූලික වශයෙන් ශීර්ෂ කිහිපයකට අදාළව ගොනු කල හැකි වන්නේය. එහි දී, සංක්‍රමණික ස්ත්‍රීන් ගමනාරම්භය තුළ කුට්ටනයට ලක්වීම, ගමනාන්තයේ දී සේවා ස්ථානය තුළ කුට්ටනයට ලක්වීම සහ සේවා ස්ථානයෙන් පරිබාහිරව කුට්ටනයේ ගොදුරු බවට පත්වීම ලෙස විච්ඡේදනය කිරීමෙන් සාකච්ඡාව ගොඩනංවා තිබේ.

**සංක්‍රමණික ස්ත්‍රීන් ගමනාරම්භය තුළ කුට්ටනයට ලක්වීම**

මානව කුට්ටනය නම් වූ යන්ත්‍රණයේ පළමු පියවර හෙවත් බඳවා ගන්නා අවධිය තුළදී ප්‍රධාන සාධක තුනක් තල්ලු කිරීමේ සාධක වශයෙන් ස්ත්‍රීන්ගේ ශ්‍රම සංක්‍රමණය විෂයෙහි බලපෑම් කළ බව අධ්‍යයනය තුළදී අනාවරණය විය. එනම්, පවුලේ ආර්ථික දුෂ්කරතා (75%), ස්ත්‍රීන්ට එරෙහි

ප්‍රචණ්ඩත්වය (5%) සහ ස්ත්‍රී විරැකියාවයි (25%)[3]. චුයාන් :2006- සිදුකරන ලද අධ්‍යයනයකට අනුව පෙන්වා දෙන්නේ දිළිඳුකම ස්ත්‍රීකරණයවීම හුදෙක් ස්ත්‍රීන් කුට්ටනයට ලක්වීම සඳහා මූලික වශයෙන් බලපානු ලබන බවයි. චුයාන් (2006) තව දුරටත් පෙන්වා දෙන්නේ ස්ත්‍රීන් පහත් කොට සැලකීම සහ ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය කාන්තාවන්ගේ සංක්‍රමණික තීරණ කෙරෙහි බලපෑම් කරන බවයි. එමෙන්ම වර්තමාන අධ්‍යයනයට අනුව අනාවරණය වූ කරුණු විමර්ශනය කිරීමේ දී අනාවරණය වන්නේ ද ඉහළ ප්‍රතිශතයක් වූ කුට්ටනයට ලක් වූ ස්ත්‍රීන්ගේ සංක්‍රමණික තීරණ කෙරෙහි ගෘහ කුටුම්භයේ පැවති ආර්ථික දුෂ්කරතා සහ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හේතු සාධක වී ඇති බවයි. එසේම එම කාන්තාවන් අඩු අධ්‍යාපන මට්ටමක් සහිත ස්ත්‍රීන් බවට අනාවරණය වූ අතර, එහි දී කිසිදා පාසල් නොගිය ස්ත්‍රීන් 7.4% ක් ද, 1-5 ශ්‍රේණි දක්වා අධ්‍යාපනය ලැබූ ස්ත්‍රීන් 3.4% ක් ද 6-8 ශ්‍රේණි දක්වා අධ්‍යාපනය ලැබූ ස්ත්‍රීන් 45% ක් ද, ආදී වශයෙන් වාර්තා විය. පෙරී සහ ඒවින් :2013- විසින් පෙන්වා දෙනු ලබන්නේ කාන්තාවන්ගේ අඩු අධ්‍යාපන මට්ටම කුට්ටනයේ ගොදුරු බවට පත්වීමට සමීපස්ථ සාධකයක් වන බවයි. එමෙන්ම වර්තමාන අධ්‍යයනයට අදාළ වූ සාධක විමර්ශනය කිරීමේදී අනාවරණය වූ ප්‍රධාන කරුණක් වූයේද, අතරමැදි පාර්ශ්වකරුවන් කුට්ටන ක්‍රියාවලියේ සක්‍රීය කොටස්කරුවන් බවට පත්වීම සඳහා කාන්තාවන්ගේ අවම අධ්‍යාපන තත්ත්වය සහ ආර්ථික දුෂ්කරතා මූලික වශයෙන් හේතු සාධක වී ඇති බවයි. විජිතා[4] මේ සම්බන්ධයෙන් දක්වන අදහස වන්නේ,

> "විජිතා යනු නාගරික ප්‍රදේශයක පදිංචි කාන්තාවකි. ඇයට දරුවන් තිදෙනෙකු සිටී. පවුලේ අගහිඟකම් දරාගත නොහැකි නිසාත්, ඇයට ස්ථිර රැකියාවක් නොවූ නිසාත්, ස්වාමි පුරුෂයාගේ නිරන්තර පහරදීම්වලට ලක්වීම නිසාත් ඇය සෞදි අරාබියේ ගෘහ සේවිකාවක් වශයෙන් පිටත්ව ගියාය. මෙම විදේශගතවීම සඳහා අසේල නම් වූ පුද්ගලයෙකු සහය දැක්වූ අතරම විදේශගතවීමට පෙර ලක්ෂ දෙකක මුදලක් ලබා දී ගමනට අවශ්‍ය පාස්පෝට් ඇතුළු අනෙකුත් ලියවිලි කිසිදු අය කිරීමකින් තොරව සකසා දෙන ලදි. විදේශගත වීමෙන් අනතුරුව සෞදියේ තෙමහල් නිවසක සේවය කළ ඇය අධික ලෙස වෙහෙසවීම හේතුවෙන් රෝගාතුර විය. අනතුරුව ඇයව නිවසින් රෝහල් ගතකරවීය. පසුව පුද්ගලයෙකු ඇයව ඔහුගේ නිවසට ගෙනගොස් ආරක්ෂාව සපයන බව පවසා ඇයව නොයෙකුත් මිනිසුන්ට ලිංගික ශ්‍රමිකයෙකු වශයෙන් විකුණමින් මුදල් උපයමින් සිටියි."
>
> (ක්ෂේත්‍ර සමීක්ෂිත තොරතුරු ඇසුරෙනි, 2016).

සමාජ ස්තරායනය තුළ, නිරන්තරයෙන් පුරුෂ මූලික සමාජ වටපිටාවක් ශ්‍රී ලාංකික සමාජ සන්දර්භය තුළ නිර්මාණය වී තිබීම හේතුවෙන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක්වන ස්ත්‍රියගේ ඉරණම තීරණාත්මක වන්නේය. නාම් :2007- සිදුකරන ලද අධ්‍යයනයකට අනුව පෙන්වා දී ඇත්තේ ලිංගිකත්වය පදනම්

[3]බහු ප්‍රතිචාර

[4]මෙම පර්යේෂණ පත්‍රිකාව පුරා සැබෑ පුද්ගල නාමයන් වෙනුවට ප්‍රතිචාරකයන්ගේ අනන්‍යතාවය අනාවරණය නොවීම සඳහා අන්වර්ථ නාමයන් භාවිත කොට තිබේ.

ISSN 2756-925X ISSN 0236-2090

කරගනිමින් සිදුකරනු ලබන නොසලකා හැරීම් තුළ කාන්තාවන් කුට්ටනයට ලක්වීමට ඉහළ සම්භාවිතාවක් පවතින බවයි.එමෙන්ම ඔෂී :2002- සිදුකරන ලද අධ්‍යයනයකට අනුව පෙන්වා දෙන්නේ ශ්‍රී ලාංකික කාන්තාවන් ජාත්‍යන්තරව සංක්‍රමණයවීම කෙරෙහි ඒකමතිකව ගනු ලබන තීරණ මූලික ලක්ෂණයක් වන බවයි. කෙසේ වුවද වර්තමාන  අධ්‍යයනයට අනුව අනාවරණය වූයේ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයන්ට ලක්වීම ඇතුළු ආර්ථික පීඩාකාරී තත්ත්වයන්ගෙන් පරිපීඩිතවන කාන්තාවන් ගමනාරම්භක රාජ්‍යය තුළ දී අතරමැදි පාර්ශ්වකරුවන්ගේ ගොදුරු බවට පත්වීම තුළ ඇතිකරනු ලබන පීඩාකාරී තත්ත්ව සංක්‍රමණික තීරණ කෙරෙහි බලපෑම් ඇතිකරන බවයි. ඒ සඳහා ණය බැදුම්කරවලට ලක්වීම වැනි සිදුවීම් නියදිය තුළ සුලබ වශයෙන් වාර්තා විය. ඒ අනුව වර්තමාන අධ්‍යයනයට අනුව සංක්‍රමණික ස්ත්‍රීන්ගෙන් 49% ක් තැරැව්කරුවන්ගේ ණය බැඳුම්කරවලට ලක්වූවන් බවට වාර්තා වූ අතර, ඒ තුළ කුට්ටනයේ බලපෑම තවදුරටත් සංකීර්ණත්වයට පත්ව ඇති ආකාරය විමර්ශනය කළ හැකිය.

**සංක්‍රමණික ස්ත්‍රීන් ගමනාන්ත රාජ්‍යයන් තුළ කුට්ටනයට ලක්වීම**

ගමනාරම්භක රාජ්‍ය තුළ සමාජ - ආර්ථික බලපෑම් තුළින් පීඩනයට ලක්වූ ස්ත්‍රීන් ගමනාරම්භක ප්‍රදේශය තුළ දී පමණක් නොව ගමනාන්ත ප්‍රදේශය තුළ දී ද අත්දකිනු ලබන්නේ අනපේක්ෂිත වූ සිදුවීම් සහ තත්ත්වය. එම තත්ත්ව තුළ කාන්තාවන් ප්‍රබල ලෙස සූරාකෑමට සහ හිංසනයට ලක්වන්නේය. වර්තමාන අධ්‍යයනයට අනුව සංක්‍රමණික කාන්තාවන් ගමනාන්ත රාජ්‍ය තුළ දී මූලික වශයෙන් සේවා ස්ථානය තුළ සහ ඉන් පරිබාහිරව සූරාකෑමට ලක්වූ ආකාරය අනාවරණය විය.

**සංක්‍රමණික ස්ත්‍රීන් සේවා ස්ථානය තුළ කුට්ටනයට ලක්වීම**

සංක්‍රමණයට පෙර අතරමැදි පාර්ශ්වකරුවන් විසින් කාන්තාවන් තුළ ගොඩනගනු ලබන සුඛෝපභෝගී සුවපහසු ජීවන තත්ත්ව හා බැඳුණු අපේක්ෂා, ගමනාන්තය තුළ ක්‍රමයෙන් භංගත්වයට පත්වන්නේය. අධ්‍යයනය තුළ දී අනාවරණය වූයේ කාන්තාවන් සේවා ස්ථානයේ දී කුට්ටනයට ගොදුරු වූ ආකාරය විවිධ ස්වරූප ගන්නා බවයි. එහිදී පෙර ගිවිසනු නොලැබූ රැකියාවල නිරතවීමට සිදුවීම, සේවා ස්ථානය තුළ දී නිවසේ හිමිකරුවන්ගේ හිංසනයට ලක්වීම, නිවසේ වෙනත් සේවිකාවන්ගේ හිංසනයට ලක්වීම, වැටුප් සහ මූලික පහසුකම් නොලැබීම, සේවා ස්ථානය තුළ මූලික අයිතිය නොලැබී යාම, භාෂාමය ගැටලු සහ කම්කරු රැකවරණය නොලැබීම හේතුවෙන් ගමනාන්ත රාජ්‍යය තුළ දී පීඩාවට ලක්වීම සහ සේවා ගිවිසුම අවසන් වූව ද සිය රටට පැමිණීමට අවස්ථාව නොලැබීම වැනි තත්ත්ව එහි දී හඳුනාගත හැකිවිය.

- **පෙර ගිවිසනු නොලැබූ රැකියාවල නිරතවීමට සිදුවීම**

කාන්තාවන් පෙර අපේක්ෂා නොකරන ලද රැකියා ක්ෂේත්‍රයන් තුළ සංක්‍රමණයෙන් අනතුරුව සේවය කිරිමට සිදුවීම මත කුට්ටන ගැටලුව තවදුරටත් සංකීර්ණ ස්වාභාවයක් ගන්නේය. චුයාන් ((2006)

ISSN 2756-925X ISSN 0236-2090
CC BY NC

සිදුකරන ලද අධ්‍යයනයකට අනුව පෙන්වා දී ඇත්තේ මානව කුට්ටනයට ලක්වන සංක්‍රමණිකයන් බොහෝ අවස්ථාවන්හිදී 3D රැකියාවල නිරතවන බවයි.

වර්තමාන අධ්‍යයනයට අදාළ සියලු කාන්තාවන් නීතිවිරෝධීව සංක්‍රමණය වී ඇති අතර, ගෝෂ් (1998) සිදුකරන ලද අධ්‍යයනයකට අනුව පෙන්වා දී ඇත්තේ නීති විරෝධීව සංක්‍රමණය වන්නන්ට අදාළ වෘත්තීය සුදුසුකම්, පුහුණුව සහ සේවා පළපුරුද්ද නොමැති බැවින් ගමනාන්ත රාජ්‍ය තුළ අවිධිමත් රැකියාවල නිරතවන බවයි. එමෙන්ම වර්තමාන අධ්‍යයනය තුළ දී අනාවරණය වූයේ ද සංක්‍රමණික සියලුම කාන්තාවන් අවම මට්ටමේ රැකියාවල (3D රැකියාවන්හි) නියුක්තවන බවයි. එහි දී ගෘහ සේවයේ යෙදෙන කාන්තාවන් 93.3% ක්ද ලිංගික ශ්‍රමය සපයන්නන් වශයෙන් කටයුතු කරන කාන්තාවන් 5.6%ක්ද කම්කරු සේවිකාවන් වශයෙන් කටයුතු කරන කාන්තාවන් 1.1% ක්ද වශයෙන් වාර්තා විය. නමුත් සංක්‍රමණයට පෙර කිසිදු කාන්තාවක් ලිංගික ශ්‍රමය සපයන්නියක ලෙස ක්‍රියාකිරීමට අපේක්ෂා නොකරන ලදි. නාම් :2007- මානව කුට්ටනය සම්බන්ධයෙන් සිදුකරන ලද අධ්‍යයනයකට අනුව පෙන්වා දෙන්නේ 8.0% ක වූ නියදිගත ස්ත්‍රීන්ගෙන් 7.0% ක් ලිංගික ශ්‍රමිකයන් ලෙස කටයුතු කරන බවයි. එමෙන්ම පෙරී සහ ඒවින් (2013- සිදුකරන ලද අධ්‍යයනයකට අනුව අනාවරණය කරනු ලබන්නේ ද කුට්ටනයට ලක්වන කාන්තාවන්ගේ කන්‍යාභාවය ඉහළ ඉල්ලුමක් පවතින සාධකයක් වන බැවින් කාන්තාවන් HIV ඒඩ්ස් ඇතුළු සමාජ රෝගවලට ගොදුරුවීමේ ඉහළ අවධානමකින් පසුවන බවයි.

- **සේවා ස්ථානය තුළ දී නිවසේ හිමිකරුවන්ගේ හිංසනයට ලක්වීම**

ෆින්ගෝල්ඩ් :2005- සිදුකරන ලද අධ්‍යයනයකට අනුව පෙන්වා දී ඇත්තේ සංක්‍රමණයේ යෙදෙන බෝහෝ කාන්තාවන් සහ ගැහැනු දරුවන් ගමනාන්ත රාජ්‍ය තුළ දී පීඩාකාරී ගෘහ සේවයට බැඳී, සේවා යෝජකයාගේ නිරන්තර අපහරණයට සහ පහරදීම්වලට ලක්වන බවයි. එමෙන්ම වර්තමාන අධ්‍යයනයට අනුව අනාවරණය වූයේ සංක්‍රමයෙන් අනතුරුව ඇතැම් කාන්තාවන්, කාමාශාව සපුරා ගැනීමට විදේශිකයන්ගේ ගොදුරු බවට පත්වී ඇති බවයි. විශේෂයෙන්ම තමා සේවා නියුක්තවන නිවසේ හිමිකරුවන්ගේ අපහරණයට ලක්වීමේ සිදුවීම් 23 ක් අධ්‍යයනය තුළ දී අනාවරණය විය. වින්දයා විස්තර කරන පරිදි,

> “මගේ නැගණිය සෞදියේ ගසීම් ප්‍රදේශයේ නිවසක සේවය කළ අතර, එහිදී ඇය වලිප්පුව රෝගයෙන් පසු වූ බැවින් ඇයට නිවසේ වැඩ කිරීමට අපහසු විය. වැඩ නොකිරීම හේතුවෙන් එම නිවසේ ස්වාමියා ඇයට දැරිය නොහැකි ලෙස වද හිංසා කර තිබේ. එබැවින් ඇය නිවසෙන් පැනගොස් ගසීම් පළාතේ පොලීසියට භාරවී ඇත. එක් පුද්ලයෙකු පොලීසියට පැමිණ තම මන්ද මානසික දරුවා රැකබලා ගන්නා මෙන් ඇයගෙන් ඉල්ලීම්කර ඇයව ඔහුගේ නිවසට ගෙනයන ලදි. දැන් ඔහු ඇයව මුදලට විකුණමින් සිටියි. බොහෝ අගහිඟකම් මැද ඇය සෞදි බලා පිටත්ව ගියේ පවුල වැටී



ISSN 2756-925X ISSN 0236-2090

CC BY NC

සිටින තත්ත්වයෙන් ගොඩ ගැනීම සඳහායි. නමුත් අවසානයේ අපි කබලෙන් ලිපට වැටුණා''

(ක්ෂේත්‍ර සමීක්ෂිත තොරතුරු ඇසුරෙනි, 2016).

බ්‍රෝච් (2008) සිදුකරන ලද අධ්‍යයනයකට අනුව පෙන්වා දී ඇත්තේ ගෘහ සේවිකාවන් වශයෙන් සංක්‍රමණය වන බොහෝ කාන්තාවන් ගමනාන්ත රාජ්‍ය තුළ දී ලිංගික ශ්‍රමය සපයන්නන් ලෙස මුදලට අලෙවි වන බවයි. වර්තමාන අධ්‍යයනයට අනුව, චින්දයා ඇගේ නැගණියගේ දරුවන් රැකබලා ගනිමින් අවිවාහක ජීවිතයක් ගත කරන අතර, එම දරුවන්ගේ සුරක්ෂාව ඇයට තහවුරුකර ගැනීමට නොහැකි තත්ත්වයක සිටින්නේ ඒ වන විට එම දරුවන්ගේ පියා ඇගේ නැගණිය සමග දිවි ගෙවීම ප්‍රතික්ෂේප කරමින් දරුවන්ගේ වගකීම් ද නොසලකා සිටින බැවිනි.ඇය සමාජය තුළ වෛශ්‍යාවක් යන්න ලේබල් වීමත්, සමාජය තුළින් ඇය බහිෂ්කරණයට ලක් වීමත් සෘජුව ඇගේ පවුල විසංවිධානය වීමට බලපෑම් ඇතිකර තිබේ. එමෙන්ම ''සෞදි ශ්‍රියා, "කටාර් ශ්‍යාමලී '',''ඩුබායි මාලා'' වශයෙන් එම ස්ත්‍රීන් සංක්‍රමණය වී සිටින රාජ්‍ය සමග හඳුන්වා දීමට සමාජය උත්සාහ දරන අතර ඒ තුළින් එම කාන්තාවන්ගේ ගෞරවණියභාවය අවතක්සේරු කිරීමට සමාජය ප්‍රයත්න දරයි. එවන් අවස්ථාවල අධ්‍යනය තුළ දී සුලභව හඳුනා ගැනීමට හැකි වූ අතර, එය හුදෙක් සංක්‍රමණික ස්ත්‍රීන්ගේ දරුවන් කෙරෙහි ඇති කරනු ලබන්නේ හුදෙක් සෘණාත්මක ප්‍රතිඵලය. එමෙන්ම පෙරී සහ ඒවින් :2013- විසින් පෙන්වා දෙනු ලබන්නේ ද සමාජය විසින් නොසලකා හැරීමට ලක්වීම කුට්ටනය නම් වූ ගැටලුව තව දුරටත් සංකීර්ණත්වයට පත්කරන බවයි.

- **සේවා ස්ථානය තුළ දී නිවසේ වෙනත් සේවිකාවන්ගේ හිංසනයට ලක්වීම**

සේවා ස්ථානය තුළ දී සේවා ස්ථානයේ ස්වාමියාගෙන් පමණක් නොව සේවා ස්ථානය තුළ සේවය කරනු ලබන වෙනත් සේවිකාවන්ගෙන් ද අධ්‍යයනයට අදාළ කාන්තාවන් හිංසනයට ලක්වූ අවස්ථා අධ්‍යයනය තුළ දී අනාවරණය විය. ශ්‍රී ලාංකික කාන්තාවන්ට ගමනාන්ත රාජ්‍ය තුළ දී වෙනත් ජාතික කාන්තාවන් සහ පුරුෂයන් සමග එකම සේවා ස්ථානය තුළ සේවය කිරීමට සිදු වේ. එහි දී එම සමාජ සබඳතා ඇතැම් අවස්ථාවලදී කාන්තාවන් කෙරෙහි ධනාත්මකව බලපෑම් ඇතිකරන විට, තවත් විටෙක සෘණාත්මක බලපෑම් ඇතිකරනු ලබයි. චතුරිකා සඳහන් කරන ආකාරයට,

> ''මගේ මව සෞදි රටේ සේවය කිරීමට ගිය අතර එය තෙමහල් නිවසක්. එම නිවසේ මෙහෙකරුවන් පිරිසක් සේවය කරන අතර නිවසේ හිමියා මගේ මවගේ කාර්යයන් කෙරෙහි දැඩි ඇල්මක් දක්වන බැවින් සහ ඇයව අගයමින් නිතර කතාකරන බැවින් නිවසේ සේවය කරන නේපාල ජාතික කාන්තාවන් දෙදෙනෙකු මවගේ ආහාරවලට නිදිපෙති දමා ඇගේ කාර්ය අකාර්යක්ෂම කර තිබේ. පසුව ඇගේ අකාර්යක්ෂම කාර්ය පිළිබඳව නිවෙස් හිමියාට අනෙකුත් කාන්තාවන් දිගින් දිගටම චෝදනා කළ අතර, නිසි වේලාවට කාර්ය නොකිරීම හේතුවෙන් නිවෙස් හිමියා මගේ මවට දරුණු ලෙස පහර දී කාමරයක රඳවා තිබේ''

ISSN 2756-925X ISSN 0236-2090

(ක්ෂේත්‍ර සමීක්ෂිත තොරතුරු ඇසුරෙනි, 2016).

සංක්‍රමණික කාන්තාවන් සේවා ස්ථානය තුළ දී නිවෙස් හිමියා සහ එම නිවසේ සේවය කරනු ලබන අනෙකුත් සේවක සේවිකාවන් සමග පවත්වාගෙන යනු ලබන සමාජ සබඳතා ඇතැම් අවස්ථාවලදී සංක්‍රමණික කාන්තාවන් තුළ කායික මානසික හිංසන තත්ත්ව උත්සන්න කරලීම කෙරෙහි ඉවහල්වන බවට අධ්‍යයනය තුළ දී අනාවරණය විය. කෙල්සි සහ තවත් අය (2013) සිදුකරන ලද අධ්‍යයනයකට අනුව පෙන්වා දී ඇත්තේ ද මානව කුට්ටනය තුළ වහල්භාවයට පත්වන කාන්තාවන් සහ ළමුන් ගමනාන්තය තුළ දී අත්දකින පීඩාකාරී තත්ත්වයන් ඔවුනගේ ශාරීරික සහ මානසික සෞඛ්‍යයට ඍණාත්මකව බලපෑම් ඇතිකරන බවයි. එහිදී කාංසාව, මානසික අවපීඩනය, මත් ද්‍රව්‍ය භාවිතයට යොමුවීම වැනි තත්ත්වය මූලික වශයෙන් අනාවරණය කර තිබේ.

- **සේවා ස්ථානය තුළදී වැටුප් සහ මූලික පහසුකම් නොලැබීම**

වර්තමාන අධ්‍යයනය තුළින් අනාවරණය වූ සාධකවලට අනුව, ගමනාන්ත රාජ්‍යය තුළ සංක්‍රමණික කාන්තාවන් සේවා නියුක්තියේදී විවිධ සංකීර්ණ තත්ත්වලට මුහුණ දී තිබේ. අධ්‍යයනය තුළ දී අනාවරණය වූ පරිදි ඒ සඳහා මූලික හේතු සාධකය බවට පත්වී ඇත්තේ කාන්තාවන්ගේ සේවා ගිවිසුම් උල්ලංඝනය වීමයි. එම තත්ත්වය වගු අංක 03 තුළින් නිරූපණය වේ.

වගු අංක 03- සේවා නියුක්තියේදී කුට්ටනයට ගොදුරුවන ආකාර

| | ප්‍රතිචාරකයන් ප්‍රමාණය |
|---|---|
| සන්නිවේදනයට අවස්ථාව නොලැබීම | 71 |
| කායික හිංසනයට ලක්වීම | 71 |
| මානසික හිංසනයට ලක්වීම | 62 |
| අපයෝජනයට ලක්වීම | 23 |
| සේවා ගිවිසුම අවසන් වුව ද සිය රටට පැමිණීමට අවස්ථාව නොලැබීම | 28 |
| ප්‍රචණ්ඩත්වය තුළ රෝගීභාවයට ලක්වීම | 06 |
| පොරොන්දු වූ වැටුප් නොලැබීම | 66 |
| මූලික අවශ්‍යතා නොලැබී යාම | 69 |
| ශක්ති ප්‍රමාණයට වඩා වැඩ කිරීමට සිදුවීම | 66 |
| | * බහු ප්‍රතිචාර |

මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර සමීක්ෂිත දත්ත ඇසුරෙන්, 2016

වගු අංක 03 ට අනුව විග්‍රහ කළ හැකි වන්නේ සංක්‍රමණික ස්ත්‍රීන්ගෙන් බහුතරයක් අපේක්ෂිත වැටුප් නොලැබීම, මූලික අවශ්‍යතා නොලැබී යාම, කායික හිංසනයට ලක්වීම වැනි තත්ත්ව තුළින් පීඩා

ISSN 2756-925X ISSN 0236-2090

විඳින බවයි. පෙරී සහ ඒවින් (2013) සිදුකරන ලද අධ්‍යයනයකට අනුව පෙන්වා දී ඇත්තේ අවම වැටුපකට ශ්‍රමය සූරාකෑම හෝ වැටුප් නොලබමින් ශ්‍රම සූරාකෑමට ලක්වීම හුදෙක් මානව කුට්ටනය විෂයයෙහි දැකිය හැකි මූලික ලක්ෂණයක් වන බවයි. එමෙන්ම චුයාන් (2006) සිදුකරන ලද අධ්‍යයනයකට අනුව අනාවරණය වන්නේ ගෘහ සේවිකාවන් සහ දරුවන් රැකබලා ගන්නන් වශයෙන් සංක්‍රමණය වන කාන්තාවන් වැටුප් රහිතව හෝ අවම වැටුප් ලබමින් ගමනාන්ත රාජ්‍ය තුළ සේවා නියුක්තවන බවයි. චතුරගේ සිද්ධි අධ්‍යයනය තුළින් අනාවරණය වන්නේ කාන්තාවන් ගමනාන්තයේ රැකියා ස්ථානයන් තුළ වැටුප් රහිතව ශක්ති ප්‍රමාණයන්ට වඩා වැඩ පැවරීම තුළින් පීඩා විඳින ආකාරය පිළිබඳවයි.

> "මගේ මව විසිට් වීසා එකකින් 2015 දී ගෘහ සේවිකාවක් වශයෙන් ඩුබායිවලට සංක්‍රමණය වුණා. රට ගියාට පස්සේ අම්මට එක දිගට පැය 21 ක් විතර වැඩ කරන්න සිද්ධවෙලා තියනවා. මාස අටකින් වැටුප් ගෙවලත් නෑ. නිවසේ හිමියා දිනක් මගේ මවට සිදුකරන ලද පා පහරක් හේතුවෙන් ඇය දරුණු උදරාබාධයකින් පීඩා විඳිනවා. ඇගේ වැඩකටයුතු මේ තත්ත්වය සමග කාර්යක්ෂමව සිදුකිරීමට නොහැකි බැවින් නිවෙස් හිමියා ඇයව නිවසින් පන්නා දමා තිබේ"
>
> (ක්ෂේත්‍ර සමීක්ෂිත තොරතුරු ඇසුරෙනි, 2016).

මෙම අධ්‍යයනය සිදුකරන කාල පරිච්ඡේදය තුළ දී සේවා ස්ථානයේ හිංසනයට ලක්වීම හේතුවෙන් රෝහල්ගත වී සිටින කාන්තාවන් හය දෙනෙකු වාර්තා වූ අතර එම සියලුම කාන්තාවන් ගෘහ සේවිකාවන් වශයෙන් අවම පහසුකම් යටතේ සේවය කරන බවට වාර්තා විය. එමෙන්ම ඉතා අපිරිසිදු වාතාවරණ යටතේ සේවය කිරීමට සිදුවූ ආකාරය "අපායක්" වැනි වචන භාවිත කරමින් ඇතැම් ප්‍රතිචාරකයන් ලබාදුන් පිළිතුරු තුළින් පැහැදිලි විය. එමෙන්ම අඛණ්ඩව සේවය කළ ද නිසි ලෙස මාසික වැටුප් ලබන එකම කාන්තාවක් සම්බන්ධයෙන් හෝ අධ්‍යයනය තුළ දී වාර්තා නොවූ අතර, සිද්ධිසේන සහ රණසිංහ:2016-සිදු කරන ලද අධ්‍යයනයකට අනුව පෙන්වා දෙන්නේ ද කුට්ටනයට ලක්වන පුද්ගලයන්ගෙන් බහුතර ප්‍රතිශතයක් වැටුප් නොලැබීම හෝ ප්‍රමාණවත් වැටුපක් නොලැබීම යන තත්ත්වය තුළින් දැඩි ලෙස පීඩනයට ලක්වන බවයි.

එමෙන්ම ගමනනාන්තය තුළ දී සංක්‍රමණික කාන්තාවන් මූලික පහසුකම් හෝ නොලබමින් වැටුප් රහිතව සේවය කරන අවස්ථා පර්යේෂණය පුරා සුලභව දැකිය හැකිවිය. කැප්ස්ටීන් (2006) සිදුකරන ලද අධ්‍යයනයකට අනුව අනාවරණය වන්නේ ගෘහ සේවිකාවන්, ඉදිකිරීම් ශිල්පීන් ලෙස සංක්‍රමණයේ යෙදෙන්නන් ගමනාන්ත රාජ්‍ය තුළ දී වැටුප් රහිතව ඉතා සංකීර්ණ පාරිසරික තත්ත්ව යටතේ සේවා නියුක්ත වන බවයි. අනිල් විස්තර කරනු ලබන්නේ

> "මගේ බිරිඳ 2014 දී ඒජෙන්සියක් මාර්ගයෙන් කටාර් රටෙහි ගෘහ සේවිකාවන් වශයෙන් සේවය කිරීමට පිටත්ව ගියා. නමුත් බිරිඳට පොරොන්දු වූ පරිදි නියම වශයෙන් වේතනයන් නොලැබීම, දිනකට සේවා කාලය පැය අටක් වුව ද දිනකට පැය 14-16 දක්වා වැඩකිරීමට

ISSN 2756-925X ISSN 0236-2090

සිදුවීම, එම වැඩකරන කිසිම අමතර කාලයක් සඳහා අමතර වැටුපක් නොගෙවීම, සිකුරාදා නිවාඩු දිනයක් වුව ද සෑම සිකුරාදා දිනකම වැටුප් රහිතව සේවය කිරීමට සිදුවීම, අසනීපයකට පවා නිවාඩු ගැනීමට නොහැකිවීම, එසේ නිවාඩු ගතහොත් වේතනයෙන් අඩුකරන බව පැවසීම, මසකට පැය 404 කට අධික කාලයක් සේවය කළද සේවා නියුක්තව සිටින පැය ගණන පැය 2020 ක් ලෙස දක්වා පඩි වාර්තා සකස් කිරීමට උත්සාහ කිරීම, ආහාරපාන ගැනීමට සුදුසු තත්ත්වයක නොතිබීම, අසනීප වූ විට ලබා ගන්නා බෙහෙත් පෙත්තට පවා මිලක් නියම කිරීම සහ වැසිකිළි ඉතිරී ගොස් අධික දුර්ගන්ධයක් පවතින ස්ථානයක නිදා ගැනීමට සිදුවීම වැනි ඉතා අභාග්‍යසම්පන්න තත්ත්වලට ඇයට මුහුණ දීමට සිදුවී තිබේ.''

(ක්ෂේත්‍ර සමීක්ෂිත තොරතුරු ඇසුරෙනි, 2016).

බල්ඩ්වින් සහ තවත් අය (2011) සිදු කරන ලද අධ්‍යයනයකට අනුව පෙන්වා දී ඇත්තේ, කුට්ටනයට ලක්වන සංක්‍රමණිකයන් සේවා ස්ථානය තුළ ලබා ගන්නා වෛද්‍ය ප්‍රතිකාර සඳහා අයකරන මුදල් ඔවුන්ගේ සමස්ත ණය බරට එක්වන බවයි. එමෙන්ම සිද්ධිසේන සහ රණසිංහ (2016) සිදු කරන ලද අධ්‍යයනයකට අනුව පෙන්වා දෙන්නේ ද, ගමනාන්ත රාජ්‍ය තුළ දී ශ්‍රී ලාංකික කාන්තාවන් ආහාරපාන ඇතුළු මූලික අවශ්‍යතා පූර්ණය නොවීමෙන් හිංසනයට ලක්වන බවයි. සිම්රාන් ඇතුළු පිරිස 2014 දී සිදුකරන ලද අධ්‍යයනයකට අනුව පෙන්වා දී ඇත්තේද මානව කුට්ටනය තුළ පුද්ගලයන්ගේ මූලික මූලික අවශ්‍යතා පූර්ණය නොවීමෙන් පීඩනයට ලක්වන බවයි. එමෙන්ම ඉහත සිද්ධි අධ්‍යයන (අනිල් සිද්ධි අධ්‍යයනයට අනුව) විමර්ශනය කිරීමේ දී අනාවරණය කරගත හැකි වන්නේ සංක්‍රමණිකයන්ගේ පූර්ණය නොවූ අපේක්ෂා සහ තම ගරුත්වය අභියෝගයට ලක්වීම ඇතුළු මානවයෙකු වශයෙන් හිමිවිය යුතු මූලික අයිති උල්ලංඝනය වීම වැනි තත්ත්ව තුළින් කාන්තාවන් මානසික වශයෙන් බෙලහීන තත්ත්වයට පත්වන බවයි.

- **සංක්‍රමණික කාන්තාවන්ට තම සේවා කාලය අවසන් වුවත් සිය රටට පැමිණීමට අවස්ථාව නොලැබී යාම**

මෙම අධ්‍යයනය තුළ දී අනාවරණය වූ තවත් මූලික කරුණක් වූයේ 3.0 වූ සංක්‍රමණික කාන්තාවන්ට තම සේවා කාලය අවසන් වුව ද සිය රටට පැමිණීමට අවස්ථාව නොලැබී යාමයි. අධ්‍යයනය තුළ දී වාර්තා වූයේ සියලු කාන්තාවන් වසර 02 සහ 03 වශයෙන් වූ සේවා කාලයක් සඳහා පමණක් සංක්‍රමණය වූ බවයි. නමුත් ඇතැම් සංක්‍රමණික කාන්තාවන් වසර 17 ක් පමණ ගමනාන්ත රාජ්‍යය තුළ රඳවා තබා ගැනීමේ සිදුවීම් අධ්‍යයනය තුළ දී අනාවරණය විය. පෙරුමාල් විස්තර කරන පරිදි,

"පෙරුමාල් යනු 33 හැවිරිදි වියේ පසුවන දරුවන් සිව් දෙනෙකුගේ පියෙකි. ඔහුගේ බිරිඳ වසර දෙකක සේවා ගිවිසුමක් සඳහා සෞදි අරාබිය වෙත සංක්‍රමණය විය. නමුත් එම නිවැසියන් ඇයට තර්ජනය කර වසර හතරකට ආසන්න කාලයක් ඇයව එම නිවසේ සිරකරගෙන සිටියි. පෙරුමාල් තම බිරිඳ නැවත එවන ලෙසට එම නිවැසියන්ගෙන් ඉල්ලා


ISSN 2756-925X ISSN 0236-2090

සිටිය ද ඔවුන් පවසන්නේ බිරිඳ නැවත එවීමට නම් වෙනත් සේවිකාවක් එවන ලෙස හෝ රුපියල් ලක්ෂ 05ක මුදලක් ලබා දෙන ලෙසයි. ඉතා දිළිඳු කටුක දුෂ්කර ජීවිතයක් ගතකරන පෙරුමාල් හට ලක්ෂ 06ක් යනු විශාල සිහිනයකි"

(ක්ෂේත්‍ර සමීක්ෂිත තොරතුරු ඇසුරෙනි, 2016).

වැටුප් එකවර ලබා දෙන බව පවසමින් සේවා කාලය තව දුරටත් දීර්ඝ කිරීම, වෙනත් සේවිකාවක් සේවයට පැමිණෙන තෙක් නිවසේ සේවය කිරීමට බල කිරීම, ගමන් බලපත්‍ර රඳවා තබා ගැනීම වැනි තත්ත්ව තුළින් සේවා යෝජකයන් ස්ත්‍රීන් බලහත්කාරී ලෙස ගමනාන්ත රාජ්‍යයන්ගේ රඳවාගෙන සිටින බවට අධ්‍යයනය තුළ දී සුලබව වාර්තා වූ අතර, එම සිදුවීම් බහුල වශයෙන් සෞදි අරාබිය, කුවේට්, ඕමාන් සහ ඩුබායි යන රාජ්‍යවල සේවා නියුක්ත කාන්තාවන් තුළින් වාර්තා විය.

- **සේවා ස්ථානය තුළ මූලික අයිතිය නොලැබීයාම**

අමිර්තලිංගම් (2011) සිදු කරන ලද අධ්‍යයනයකට අනුව පෙන්වා දෙන්නේ, මානව කුට්ටනය නම් වූ අභියෝගය හමුවේ බොහෝ සංක්‍රමණිකයන් මානව හිමිකම් උල්ලංඝණය වීම, මූලික නිදහස නොමැතිවීම යන තත්ත්වය නිසා ගමනාන්ත රාජ්‍ය තුළ හිංසනයට ලක්වන බවයි. එමෙන්ම වර්තමාන අධ්‍යයනයට අනුව අනාවරණය වන්නේ ද ගමනාන්ත රාජ්‍ය තුළ දී කුට්ටනයට ගොදුරුවී සිටින බොහෝ කාන්තා සේවා ගිවිසුම් උල්ලංඝනය වීම තුළින් පමණක් නොව ගමනාන්තය තුළ දී ආගමික ඇදහීම් සඳහා වන අයිතිය වැනි මානවයෙකු වශයෙන් හිමිවිය යුතු මූලික අයිතිය පවා හුදෙක් උල්ලංඝනය වීම තුළ ප්‍රබල ලෙස මානසික සංකූලතාවලට ලක්වී ඇති ආකාරය යි. අනුලාගේ සිද්ධි අධ්‍යයනයට අනුව අනාවරණය වූයේ ඇගේ දියණියගේ ගමන් මල්ලෙහි තිබූ පිරිත් පොතක් සේවය කළ නිවසේ ගෘහ මූලිකයාට හමුවීම හේතුවෙන් එම නිවසෙන් ඇයව වැටුප් රහිතව නෙරපා දමා ඇති ආකාරයයි. නමුත් ඇයගේ අයිතිය සම්බන්ධයෙන් හෝ සේවා වියුක්තිය තුළ ඇය මුහුණපාන ගැටලුකාරී තත්ත්වයන්ගෙන් ඇය මුදවා ගැනීම සඳහා කිසිදු පාර්ශ්වකරුවෙකු ඉදිරිපත් නොවීය.

- **භාෂාමය ගැටලු හේතුවෙන් ගමනාන්ත රාජ්‍ය තුළ දී පීඩාවට ලක්වීම සහ කම්කරු රැකවරණය නොලැබීම**

අධ්‍යයනය තුළ දී අනාවරණය වූ තවත් මූලික සාධකයක් වූයේ භාෂාමය ගැටලු හේතුවෙන් ගමනාන්ත රාජ්‍යය තුළ දී කාන්තාවන් පීඩනයට ලක්වන ආකාරයයි. ඕනෑම සමාජයක් තුළ මිනිසුන් සමාජ සබඳතා ගොඩනගා ගැනීමේ දී සමාජ රැකවරණය ලබා ගැනීම යන අරමුණ යුහුසුළුව බලපානු ලබන්නේය. නමුත් ගමනාන්ත රාජ්‍ය තුළ දී කායික මානසික වශයෙන් හිංසනයට ලක්වන ස්ත්‍රීන් ඒ කෙරෙහි තව දුරටත් යොමු වීම සඳහා භාෂාමය ගැටලු මූලික වශයෙන් බලපා ඇති ආකාරය අධ්‍යයනයේ දී අනාවරණය විය. එහි දී සේවා ස්ථානවලින් නෙරපා දැමීම, සාවද්‍ය චෝදනා ලැබ සිරගත කරවීම, ශ්‍රම සූරාකෑම හෝ ලිංගික සූරාකෑමට ලක්වීම වැනි අවස්ථාවලදී කාන්තාවන්ට

ISSN 2756-925X ISSN 0236-2090

තම අයිතිය වෙනුවෙන් හඬක් නැගීමට හෝ සිදුවන හිංසන සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කිරීමට හෝ හැකි භාෂාමය කුසලතාවය නොවීම තුළ බොහෝ කාන්තාව තව දුරටත් ගමනාන්ත රාජ්‍ය තුළ සූරාකෑමට ලක්වන ආකාරය අධ්‍යයනය තුළ දී අනාවරණ විය. ක්‍රිෂ්ණකාන්ගේ සිද්ධි අධ්‍යයනයට අනුව අනාවරණය වූයේ ඔහුගේ බිරිඳ සෞදි අරාබියේ සේවය කරමින් සිටින අතර නිවසේ ගෘහ මූලිකයා මිය යාමෙන් අනතුරුව නිවසේ දරුවන් විසින් ඇයව නිවසෙන් සාහසික ලෙස නෙරපා දමා ඇති ආකාරයයි. මේ වන විට ඇය සෞදි අරාබියේ රියාද් සිර කඳවුරක දිවිගෙවයි බල්ඩ්වින් සහ තවත් අය (2011) සිදු කරන ලද අධ්‍යයනයකට අනුව පෙන්වා දෙන්නේ ද, කුට්ටනයට ලක්වන වින්දිතයන් ගමනාන්ත රාජ්‍ය තුළ දී වහල්භාවය සමාන තත්ත්ව අත්විඳීම සඳහා ගමනාන්ත රාජ්‍ය තුළ කම්කරු රැකවරණය නොලැබීම මූලික හේතුවක් වන බවයි.

**සංක්‍රමණික ස්ත්‍රීන් සේවා ස්ථානයෙන් පිටත කුට්ටනයට ලක්වීම**

සේවා ස්ථානය තුළ දී අපිරිසිදු, අපහසු රැකියාවල පමණක් නොව ලිංගික ශ්‍රමය සපයන්නන් වැනි අනතුරුදායක රැකියාවල නිරතවීමට කාන්තාවන්ට සිදුවී තිබේ. මෙහිදී 6.9% වූ සංක්‍රමණික ස්ත්‍රීන් සේවා ස්ථානයේ සිදුවන හිංසනය දරාගැනීමට නොහැකිවීම තුළ සේවා ස්ථානයෙන් බැහැරව යාමට උත්සාහ දැරූ අවස්ථාව වර්තමාන අධ්‍යයනය තුළ දී අනාවරණය විය. නමුත් එම තත්ත්ව යටතේ මානව කුට්ටනයේ සංකීර්ණතාවය තව දුරටත් තීව්‍ර වී ඇති ආකාරය අධ්‍යයනය තුළ දී අනාවරණය විය.

වගු අංක 04-සංක්‍රමණික ස්ත්‍රීන් සේවා ස්ථානයෙන් පැනයාම තුළ මුහුණ දුන් දුෂ්කරතා

| මුහුණ දුන් දුෂ්කරතා | ප්‍රතිචාරකයන් ප්‍රමාණය |
|---|---|
| නීත්‍යානුකූල ලියවිලි නොමැති බැවින් පොලිසිය මගින් අත් අඩංගුවට ගැනීම | 17 |
| වෙනත් නිවෙස්වල පුද්ගලයින් රඳවා තබා ගැනීම | 6 |
| ඒජන්සි පුද්ගලයින්ගේ අඩස්සියට නතුවීම | 12 |
| වෙනත් රටවලට බලෙන් සංක්‍රමණය කරවීම | 2 |
| වෙනත් නිවෙස්වලට බලෙන් රැකියා සඳහා යැවීම | 20 |
| තානාපති කාර්යාලවල අඩස්සියට නතුවීම | 6 |
| ගෘහ මූලිකයා විසින් සාවද්‍ය චෝදනා සිදුකොට සිරගත කරවීම | 6 |
| කඳවුරු තුළ නවාතැන් ගැනීමට සිදුවීම | 3 |
| විවිධ අනතුරුවලට ලක්වීම හේතුවෙන් රෝහල්ගත වීම | 5 |
| | * බහු ප්‍රතිචාර |


ISSN 2756-925X ISSN 0236-2090
cc BY NC

මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර සමීක්ෂිත දත්ත ඇසුරෙන්, 2016

වගු අංක 04 තුළින් අනාවරණය වන ආකාරයට වර්තමානය වන විට මෙම කාන්තාවලට විවිධ අවිනිශ්චිත පීඩාකාරී පාරිසරික තත්ත්වයක් යටතේ රැඳී සිටීමට සිදුවී තිබේ. සිදුකරන ලද සිද්ධි අධ්‍යයනවලට අනුව අනාවරණය වූයේ මේ අතරින් ඉතා දරුණුතම තත්ත්වය වනුයේ ඒජන්සි පුද්ගලයන්ට නතු වූ කාන්තාවන් ඉතා සාහසික ලෙස හිංසනයට ලක්වී සිටින ආකාරයයි. ඉස්මාන් සඳහන් කරන පරිදි,

> "ඉස්මාන් යනු 65 හැවිරිදි මුස්ලිම් අයෙකි. ඔහුගේ දියණිය ඩුබායි රටේ ගෘහ සේවිකාවක් වශයෙන් සංක්‍රමණය වුව ද ඇය සේවය කළ නිවසේ හිංසනයට ලක්වීම හේතුවෙන් ඇය රාසල් කයිමාවල පිහිටි ඒජන්සියකට ගොස් පැමිණිලි ඉදිරිපත් කිරීමෙන් පසු එම ඒජන්සිය මගින් ඇයව රදවාගෙන බලහත්කාරයෙන් වෙනත් නිවසකට යැවීමට තැත්කර ඇත. ඇය එයට අකමැතිවීම හේතුවෙන් ඇයව පුළුස්සා තිබේ. ඇයව නැවත එවීමට නම් ලක්ෂ තුනක මුදලක් ඉස්මාන්ගෙන් ඉල්ලා සිටියි. කුලී නිවසක කැවිලි පිලියෙළ කිරීමෙන් ජීවත්වන ඔහු ඇගේ කුඩා දරුවන් ද රැකබලා ගනිමින් ඉතා ඛේදනීය දිවියක් ගෙවමින් සිටියි"
>
> (ක්ෂේත්‍ර සමීක්ෂිත තොරතුරු ඇසුරෙනි, 2016).

ජයතිලක (2008) සිදුකරන ලද අධ්‍යයනයකට අනුව පෙන්වා දී ඇත්තේ කුට්ටනයට ලක්වන ස්ත්‍රීන් සේවා යෝජකයන්ගේ පමණක් නොව ගමනාන්ත රාජ්‍ය තුළ කුට්ටන ක්‍රියාවලියේ තෙවන පාර්ශ්වකරුවන් වශයෙන් පෙනී සිටින ඒජන්සිකරුවන්ගේ දරුණු හිංසා සහගත ග්‍රහණයට ලක්වන බවයි. එමෙන්ම වර්තමාන අධ්‍යයනය තුළ දී ඉස්මාන්ගේ සිද්ධි අධ්‍යයනය තුළින් අනාවරණය වන්නේ ද කාන්තාවන්ට වහල්භාවයට සමාන තත්ත්ව ගමනාන්ත රාජ්‍ය තුළ දී අත්දැකීමට සිදුව ඇති බවයි. මෙහිදී මනෝ කායික වශයෙන් පීඩාවට පත්ව සිටින්නේ හුදු සංක්‍රමණික කාන්තාව පමණක් නොව ඇගේ පවුලේ සාමාජිකයන් ද වේ. ආර්ථික අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමේ අපේක්ෂාවෙන් මෙම සංක්‍රමණික කාන්තාවන් සංක්‍රමණය වුව ද කුට්ටනයට ලක්වීම තුළ ඔවුන් මුහුණපාන ගැටලුකාරී තත්ත්වයන්ගෙන් එම කාන්තාවන් මුදා ගනිමින් එම කාන්තාවන් නැවත සිය රටට ගෙන්වා ගැනීම සඳහා පවුලේ සාමාජිකයන් උත්සාහ දරන පසුබිමක 63.3% ප්‍රතිචාරකයන් ප්‍රමාණයක් ඒජන්සිකරුවන්ටද 5.3% ප්‍රතිචාරකයන් ප්‍රමාණයක් වෙනත් අතරමැදි පාර්ශ්වකරුවන්ට ද 31.6% ප්‍රතිචාරකයන් ප්‍රමාණයක් සේවා ස්ථානයේ පුද්ගලයන්ටද කප්පම් මුදල් වශයෙන් හෝ වන්දි මුදල් වශයෙන් මුදල් ගෙවීමට සිදුවී ඇති බවට වාර්තා විය.

එමෙන්ම වර්තමාන අධ්‍යයනයට අනුව අනාවරණය වන්නේ ගමනාන්ත රාජ්‍යය තුළ සිරභාරයට ලක්වීම හේතුවෙන් සංක්‍රමණික කාන්තාවන් 22 නැවත සිය රටට පැමිණීමට පැවති අවකාශය අහිමි වී ඇති බවයි. ඒ අතරින් කාන්තාවන් 17 දෙනෙකු නීති විරෝධීව සංක්‍රමණය වීම තුළ සහ ඔවුන්ගේ ගමන් බලපත්‍ර නිවසේ ගෘහ මූලිකයන් රඳවා තබා ගැනීමේ හේතු මත නීත්‍යානුකූල අවසරයකින් තොරව ගමනාන්ත රාජ්‍යවල සංචලනය වීම හේතුවෙන් අත්අඩංගුවට ලක්වී ඇති බවයි. එමෙන්ම

ISSN 2756-925X ISSN 0236-2090

තවත් සංක්‍රමණික කාන්තාවන් 7 දෙනෙකු තමා සේවය කළ නිවසේ ගෘහ මූලිකයන්ගේ සාවද්‍ය චෝදනා ලැබ සිරගතවීමේ සිදුවීම් වාර්තා විය. එහි දී අනාවරණය වූයේ සංක්‍රමණයට පෙර එම සංක්‍රමණිකයන් අනුමත කරන ලද සේවා ගිවිසුමට අදාළ කරුණු උල්ලංඝණය කළ බවට ගෘහ මූලිකයන් විසින් චෝදනා කිරීමයි. උදාහරණ වශයෙන් නිවසේ මුදල් සොරකම් කිරීම, වීදුරුවක් බිඳීම වැනි සාවද්‍ය චෝදනා සිදුකරමින් එම කාන්තාවන් සිරගත කරන ලදි. එවිට එම කාන්තාවන් සඳහා සිය රටට පැමිණීමට ගෘහ මූලිකයා විසින් දැරිය යුතු පිරිවැය නිෂ්ප්‍රභ වන්නේය. රාජිණී දක්වන ආකාරයට,

> “මගේ දියණිය 2013 දී ලංකාවට පැමිණිය යුතුව තිබුණත්, ඇය මා හට දුරකථන ඇමතුමක් ගෙන පවසා සිටියේ නිවසේ වෙනත් මෙහෙකාරියකගේ මරණය වෙනුවෙන් චෝදනා කරමින් නිවසේ ගෘහ මූලිකයා ඇයව සිරගත කර ඇති බවයි. මේ වන විට ඇය කුවේටයේ සුලවියා සිරගෙදර සිටින අතර තවම ඇයට නිදහස හිමිවී නැත. මගේ දියණිය නොකළ වරදකට සිරගත වී සිටියි. ඇයව ගෙන්වා ගැනීමට මා බොහෝ දෙනෙකුගේ පළිසරණ පැතුවද ඇය මිනීමරුවකු බව පවසමින් කිසිවකු මා හට උදව් කිරීමට ඉදිරිපත් නොවේ”
>
> (ක්ෂේත්‍ර සමීක්ෂිත තොරතුරු ඇසුරෙනි, 2016).

ගමනාන්ත රාජ්‍ය තුළ සාවද්‍ය චෝදනා ලැබ සිරගතව සිටින කාන්තාවන් ගමනාරම්භක රාජ්‍ය තුළ මිනීමරුවන් සහ සොරුන් ලෙස සමාජගත වීම තුළ, එම සංක්‍රමණික පවුල දෙස පිළිකුල් සහගත ලෙස දකින සමාජමය විනිශ්චය හමුවේ සංක්‍රමණික කාන්තාවන් පමණක් නොව හුදු ගෘහ කුටුම්භයේ සෙසු සාමාජිකයන් ද පීඩාවලට ලක්ව සිටියි.

**සමාලෝචනය**

මෙම ලිපියේ අඩංගු පර්යේෂණ දත්ත සහ තොරතුරු විශ්ලේෂණය තුළින් තහවුරු කෙරෙනුයේ ගමනාන්ත රාජ්‍ය තුළ දී කාන්තාවන් නොයෙකුත් වාචික හිංසනවලට, කායික හිංසනවලට සහ මානසික හිංසනවලට ගොදුරු වන බවයි. තවද ශ්‍රමය සූරා කෑම සහ ලිංගික වශයෙන් සූරාකෑම යන තත්ත්වය කාන්තාවන් අත්විඳීම සඳහා ගමනාන්ත රාජ්‍ය තුළ ස්ත්‍රීන්ගේ සේවා නියුක්තික ස්වාභාව මූලික වශයෙන් බලපෑම් ඇතිකර තිබෙන බවයි. අපිරිසිදු තත්ත්වය යටතේ, අපහසු මෙන්ම අවදානම් රැකියාවල නිරත වීම තුළ කාන්තාවන්ගේ නිදහස, සාධාරණත්වය, මානව ගරුත්වය සහ ආරක්ෂාව යන සතර ආකාර වූ අයිතිය උල්ලංඝනය වී ඇති බවට අධ්‍යයනය තුළ දී අනාවරණය විය. කුට්ටනයට ලක් වූ ස්ත්‍රීන්ගේ රැකියා සම්බන්ධයෙන් විමර්ශනය කරමින් ජැක්සන් (2006) විසින් සිදු කරන ලද අධ්‍යනයකට අනුව පෙන්වා දෙන්නේ ද කුට්ටනයට ලක්වන ස්ත්‍රීන් අක්‍රමවත් සහ අපිරිසිදු රැකියාවල ගමනාන්තය තුළ දී නියැළෙන බවයි. බලහත්කාරී ශ්‍රම යෙදවුම් තුළින් වහල්භාවයේ නව ස්වභාවය අත්දකිනා රැකියා නියුක්තික ස්ත්‍රීන් ගෞරවාන්විත රැකියා සම්බන්ධයෙන් පවතින හිඟකම, ස්ත්‍රීපුරුෂ සමාජභාවය තුළ නොසලකා හැරීමට ලක්වීම, දිළිඳුකම කාන්තාකරණය වීම යන තත්ත්වය තුළ කුට්ටනයේ ගොදුරු බවට පත් වී ඇති බවට වර්තමාන අධ්‍යයනය තුළින් තවදුරටත් අනාවරණය

ISSN 2756-925X ISSN 0236-2090

විය. එමෙන්ම කුට්ටන ක්‍රියාවලිය තුළ දී ශ්‍රම සංක්‍රමණ ක්‍රියාවලිය හරහා පැමිණෙන අතරමැදි පාර්ශ්වකරුවන්ගේ වංචා සහගත උපක්‍රම, ණය බැඳුම්කර, තර්ජනවලට ලක්වන ස්ත්‍රීන් බඳවා ගන්නා අවධිය තුළ, ප්‍රවාහනය කිරීමේ අවධිය තුළ මෙන්ම සූරා කෑමට ලක්වන අවධිය තුළ ආදී වශයෙන් වූ අඛණ්ඩ යන්ත්‍රණයක් වශයෙන් ක්‍රියාත්මක වන්නා වූ සමස්ත කුට්ටන ක්‍රියාවලිය තුළදීම කායික සහ මානසික වශයෙන් උභය හිංසනයකට ලක්වන්නේ මූලික මානව අයිතිය උල්ලංඝනය වීමේ තත්ත්වය තුළය. මෙහි දී සඳහන් කළ යුතු මූලික සාධකයක් වන්නේ මානව කුට්ටනය හා සංක්‍රමණය අතර සමීප සම්බන්ධතාවක් පවතින නමුත් මානව කුට්ටනය වැළැක්වීම සම්බන්ධයෙන් සංක්‍රමණ නීති දැඩි කිරීම තුළ නීතිවිරෝධීව සංක්‍රමණ ධාරාවක් නිර්මාණය වීම හා ඒ තුළ කුට්ටන ගැටලුව තව දුරටත් ප්‍රසාරණය වීමක් සිදුවන බවයි.

එබැවින් අඩු ආර්ථික මට්ටමකින්, අධ්‍යාපන මට්ටමකින්, විරැකියාවෙන් පීඩා විඳින ශ්‍රී ලාංකික ස්ත්‍රීන් සඳහා මෙරට ඇඟලුම් සේවා ආශ්‍රිත නිෂ්පාදන වැනි සේවා අවස්ථාවල නිර්මාණය කිරීමේ වැඩපිළිවෙලක් සකස් කිරීම කාලීන අවශ්‍යතාවක් බවට පත් වී තිබේ.එමෙන්ම ආර්ථික සාධකවලට අමතරව ස්ත්‍රී පුරුෂ සමජභාවමය ගැටලු කුට්ටන ගැටලුව නිර්මාණය කිරීම විෂයයෙහි දායක වන බැවින් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සම්බන්ධයෙන් ගම් මට්ටමින් ග්‍රාම සේවක නිලධාරින්, ප්‍රාදේශීය ලේකම්වරුන් හා පොලිසියේ මැදිහත්වීම සිදුකළ යුතුව ඇත.

එමෙන්ම නීති විරෝධී සංක්‍රමණයට අවශ්‍ය පසුබිම් නිර්මාණය කරන තැරැව්කරුවන් සම්බන්ධයෙන් දැඩි නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු අතර, සංක්‍රමණිකයන් වෙනත් රටවල සේවය සඳහා යවනු ලබන රැකියා නියෝජිත ඒජන්සිවල ගුණාත්මක තත්ත්වය විමර්ශනය කිරීම සඳහා විමර්ශන නිලධාරීන් පත් කරමින්, නීති විරෝධී රැකියා ඒජන්සි ආයතනවලට එරෙහිව නීතිමය පියවර ගත යුතුය.

එමෙන්ම ගමනාන්ත රාජ්‍යය තුළ කුට්ටනයට ගොදුරුවන පුද්ගලයන්ට අවශ්‍ය නීතිමය සුරක්ෂාවන් සැලසීම සඳහා භාෂා පරිවර්තකයන් ලබාදීමේ වැඩපිළිවෙලක් සැකසිය යුතුය. හුදෙක් නුපුහුණුව හා භාෂා කුසලතාවක් නොමැති පුද්ගලයන් සංක්‍රමණය වීමත් ඔවුන් කුට්ටනයට ගොදුරු වීමත් තුළ ඇතැම් අවස්ථාවලදී තම නිදොස් බව ඔප්පු කිරීමට අවශ්‍ය භාෂාමය හැකියා නොමැතිවීම තුළ නොයෙක් යුක්ති සහගත නොවන සංකීර්ණ අවස්ථාවලට කුට්ටනකරුවන්ට මුහුණ දීමට සිදු වේ. මෙවැනි අවස්ථාවලින් පුද්ගලයන් මුදවා ගැනීම සඳහා මෙවැනි යන්ත්‍රණයක් සකස් විය යුතුය. එමෙන්ම කුට්ටනයට ගොදුරුවන්නන් අඩු අධ්‍යාපනයක් සහිත පුද්ගලයින් වන බැවින් සංක්‍රමණ නීති සම්බන්ධයෙන් හා කුට්ටන ගැටලුව සම්බන්ධයෙන් සන්නිවේදන මාධ්‍ය ඔස්සේ රාජ්‍ය මැදිහත්වීමකින් යුතුව දැනුවත් කිරීමේ වැඩසටහන් හා ප්‍රචාරණය ලබාදිය යුතුය. එමෙන්ම මානව කුට්ටනය ගැටලුවේ පවතින සංකීර්ණත්වය පිළිබඳ පුළුල් දැනුවත්භාවයක් සමස්ත සමාජයට ලබාදිය යුතු වන්නේය.

ISSN 2756-925X ISSN 0236-2090
BY NC

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

Afolayan, A. A., (2001). *Issues and Challenges of Emigration Dynamics in Developing. International Migration,* 39 (4), p. 10.

Amirthalingam, K., Jayatilaka, D., & Liyanage, N., (2011). *Victims of Human Trafficking in Sri Lanka: Narratives of women, children and youth. ILO Study.*

Baldwin,, S. B., Eisenman, D. P., Sayles, J. N., Ryan, G., & Chuang, K. S., (2011). *Identification of Human Ttrafficking Victims in Health Care Settings. Health and Human Rights*, 13(1), pp. 36-49.

Basu, R., (2003). *Trafficking of Women: Confused Responses.* Combat Law, Volume August-September.

Bravo, K. E., (2008). *Toward A Labor Liberalization Solution to Modern Trafficking in Humans*: *Proceedings of the Annual Meeting*. American Society of International Law, Volume 102, pp. 66-69.

Chuang, J., (2006). *Beyond a Snapshot: Preventing Human Trafficking in the Global Economy*. *Indiana Journal of Global Legal Studies*, 13(1), pp. 137-163.

Feingold, D. A., (2005). *Human Trafficking. Foreign Policy,* 150(32), pp. 26-30.

Ghosh, B., Masses , H., & Shores, U., (1998). *Insights into Irregular Migration.* European Journal of Population, Volume 201.

International Labour Office., (2005). *Human Trafficking and Forced Labour Exploitation: Guidelines for Legislation and Law,* Geneva: ILO.

Jackson, N., (2006). *Human Traffic and Transnational Crime: Eurasian and American Perspectives by Sally Stoecker*. Europe-Asia Studies, 58(1), pp. 127-128.

Jayatilaka, R., (2008). *Women Migrant Workers and Trafficking in Sri Lanka,* Colombo: women's Education and Research Center.

ISSN 2756-925X ISSN 0236-2090
CC BY NC

Kapstein, E. B., (2006). *The New Global Slave Trade*. *Foreign Affairs,* l85(6), pp. 103-115.

Kara, S., (2011). *Supply and Demand: Human Trafficking in the Global Economy*. *Harvard International Review,* l33(2), pp. 66-71.

Nam, J. S., (2007). *The Case of the Missing Case: Examining the Civil Right of Action for Human Trafficking Victims*. Columbia Law Review, 107(7), pp. 1655-1703.

Oishi, N., (2002). *Gender and Migration An Integrative Approach: Sandiego,* s.l.: University of California.

Pathirage, J., and Collyer, M., (2011). *Capitalizing Social Networks: Sri Lankan Migration to Italy*. *Ethnography,* 112(3), p. 315–333.

Perry, K. M. &. M. L Perry, K. M and McEwing, L., (2013). *How Do Social Determinants Affect Human Trafficking in Southeast Asia, and What Can We Do*. *Health and Human Rights,* 115(2), pp. 138-159.

Siddhisena, K. A and Ranasinghe, M. A., (2016). *Women on the move: Human Trafficking in Sri Lanka*. Sri Lanka journal of Population Studies, 15(16), pp. 27-40.

Sri Lanka Bureau of Foreign Employment., (2014). *Annual statistical report,* Colombo: Sri Lanka Bureau of Foreign Employment.

Sri Lanka Bureau of Foreign Employment., (2015). *Hand book,* Colombo: Sri Lanka Bureau of Foreign Employment.

Sri Lanka Bureau of Foreign Employment., (2017). *Hand book,* Colombo: Sri Lanka Bureau of Foreign Employment.

United Nations., (2000). *Protocol to Prevent, Suppress and Punish Trafficking in Persons, Especially Women and Children,* New York: Supplementing the United Nations Convention against Transnational.

United Nations., (2014). *Global report on Trafficking in persons,* New York: United Nations. Office on Drugs and Crime.

ISSN 2756-925X ISSN 0236-2090

Wijers, M., & Chew, L. L.,(1997). *Trafficking in Women Forced Labour and Slavery Like Practices in Marriage, domestic labour,* Netherlands: Foundation Against Trafficking in Women.

Zimmerman, Y. C., (2010). *Rethinking Sex and Religion in the United States' Initiative to Combat Human Trafficking*. *Feminist studies in the religion,* 26(1), pp. 79-99.

ISSN 2756-925X ISSN 0236-2090

cc BY NC